# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

## ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් හැකියාවන් හා වෘත්තිය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (1) අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ආයතනයේ මානව සම්පත් සංවර්ධනය සහ පරිපාලන ක්‍රියාවන් සම්බන්ධ රාජකාරි කටයුතු පිළිබඳ වගකීම් දැරීම, සේවක සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, විශේෂයෙන්ම කළමනාකරණ ශ්‍රේණි සඳහා ක්‍රමානුකූල මානව සම්පත් සංවර්ධන වැඩසටහන් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම, ආයතනයේ සැපයුම් කාර්යයන් සහ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් කාර්යය මණ්ඩලය පරිපාලනය කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණ/ රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය කළමනාකරණ/ව්‍යාපාර පරිපාලන(මානව සම්පත් කළමනාකරණ විශේෂිත)/කළමනාකරණය (මානව සම්පත් කළමනාකරණ විශේෂිත)/වාණිජ්‍ය උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක සාමාජිකත්වය

   **සහ**

   ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

   **සහ**

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

### (2) අධ්‍යක්ෂ - වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

අපනයනකරුවන්ට අපනයන ඇසුරුම්කරණය, අන්තර් ජාතික වෙළඳාම සඳහා විද්‍යුත් මාධ්‍ය භාවිතය, ප්‍රකාශන, සම්මන්ත්‍රණ සහ වෙනත් අදාළ ප්‍රදර්ශන, අනුසාරයෙන් නැව්ගත කරන්නන්, විදේශීය ගැනුම්කරුවන් සහ විදේශ වෙළඳාමට සම්බන්ධ රාජ්‍ය ආයතන වලට ඵලදායී හා කාර්යක්ෂම වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු සේවාවක් සැපයීම සඳහා වගකීම දරයි. අදාළ තොරතුරු ලබා ගැනීම, සැකසීම, විශ්ලේෂණය කිරීම, අපනයනකරුවන්ට උපදේශන සේවා සැපයීම, ශ්‍රී ලංකාව සහ විදේශීය වෙළඳපළවල වෙළඳාම ආශ්‍රිත දත්ත පද්ධති ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම, අපනයනය සම්බන්ධ පැනනගින බාධා/ගැටළු විසඳීම සඳහා අපනයනකරුවන් සහ අදාළ සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම.

### (3) අධ්‍යක්ෂ - කාර්මික නිෂ්පාදන (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

සැපයුම් සංවර්ධනය, තාක්ෂණික සංවර්ධනය, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම , ඇසුරුම් සංවර්ධනය හා පුහුණුව , නිෂ්පාදන සංවර්ධනය ආරම්භ කිරීම සහ එම නිෂ්පාදන අපනයන වෙළඳපලට අනුවර්තනය කිරීම ඇතුළු ඒකාබද්ධ වැඩසටහන් තුළින් තෝරාගත් කාර්මික නිෂ්පාදන සමූහයක අපනයන කාර්යය සාධනය වැඩි දියුණු කිරීම, අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා වෙළඳපළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**සුදුසුකම් හා පළපුරුද්ද (2) සහ (3) : (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ජාත්‍යන්තර සම්බන්ධතා / ආර්ථික විද්‍යාව / වණිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක සාමාජිකත්වය

   **සහ**

   ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රක පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

   **සහ**

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

### (4) අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (HM 1-1)

**පුරප්පාඩු ගණන (01)**

**රැකියා විස්තරය :**

ආයතනයට තොරතුරු තාක්ෂණ සේවා සැපයීම, වෙළඳ ද්වාරයක් පවත්වාගෙන යාම, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, විද්‍යුත් සන්නිවේදනය, ඊ-ප්‍රවර්ධනය යනාදිය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් කිරීම සහ තීරණ ගැනීම. ආයතනයේ වත්මන් සහ අනාගත ව්‍යාපාරික ඉලක්ක සපුරාලීමට අවශ්‍ය විසඳුම් සැපයීම. ඊ-රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින් හිතකර තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑම.

**සුදුසුකම් හා පළපුරුද්ද : (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ පරිඝණක විද්‍යාව/ තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ උපාධියක්

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති)

   **සහ**

   ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රක පිළිගත් වෘත්තිය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය

   **සහ**

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

**වැටුප් පරිමාණය HM 1-1 (1), (2), (3) සහ (4) තනතුරු සඳහා :**

රු. 80,295/- 15 X 2,270 - රු. 114,345/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමය (HM 1-1) : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.**

**වයස් සීමාව (HM 1-1) :**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

### වෙනත් සුදුසුකම්

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

### ඉහත තනතුරු සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :

- 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව නිල වාහනයකට හිමිකම් ඇත.
- අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමය.
- සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

### අයදුම් කිරීමේ පිළිවෙළ :

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 08 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ **www.srilankabusiness.com** වෙබ් අඩවියෙන් ලබාගත් ("Announcements" කාණ්ඩය යටතේ) ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පතක් **2023.12.30** දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්, අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

අංක: 02/2020 දරන **2020.10.26** දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව අනුමත තනතුරු පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ වගකීම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත පවරා ඇත.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB – EDB ටවර්, අංක 42, නවම් මාවත, කොළඹ 02**
**දුර : 011-2300700**